# ලංසු යෝජනා කැඳවීම(ද්විත්ව කවර ක්‍රමය)

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## වසර දෙකක කාලයක් සඳහා ආපන ශාලාව (Cafeteria Service) පවත්වාගෙන යාම

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2024.06.01 දින සිට මාස තුනක (3) පරිවාස කාලයකට යටත්ව වසර දෙකක කාලයක් සඳහා මෙම ආයතනයේ ආපන ශාලාව උසස් තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද තාක්ෂණික යෝජනා හා මූල්‍ය යෝජනා ලංසු ද්විත්ව කවර ක්‍රමයට කැඳවනු ලැබේ.

1. ලංසුකරුවන් සපුරාලිය යුතු මූලික සුදුසුකම්

- පසුගිය ආසන්න වසර 10 ඇතුලත රජයේ, රජයට අනුබද්ධ ආයතනයක හෝ පුද්ගලික අංශයේ ආයතනයක් වෙනුවෙන් අවම දෛනික පුද්ගලයින් 500ට වැඩි පිරිසක් සම්බන්ධවන උසස් තත්වයෙන් ආපන ශාලා සේවා අවම වශයෙන් අඛණ්ඩව වසර එකක (01) සේවා කාලයක් සහිතව වසර දෙකක පළපුරුද්ද සපුරා තිබිය යුතුය.
- රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩකර අසාදු ලේඛණගත නොවී තිබිය යුතුය.
- මෙවැනි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී පසුගිය ආසන්න වසර 05 තුළ ශ්‍රී ලංකාවේ කිසිදු අධිකරණයකින් කිසියම් ආකාරයක දඬුවමක් හෝ අවවාදයක් නොලැබූ ආයතනයක් විය යුතුය.
- පසුගිය ආසන්න වසර 02 තුළ මෙවැනි ව්‍යාපාර කටයුතු වලින් උපයන ලද සාමාන්‍ය ආදායම අවම රුපියල් මිලියන 15කට වැඩි විය යුතුය.
- 2023.12.31 දිනට කාරක ප්‍රාග්ධනය අවම රුපියල් මිලියන 03 ක් විය යුතුය.

2. ලංසු ලියවිලි ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 3000.00 ක මුදල ආයතනයේ සරප් වෙත මුදලින් ගෙවා ආයතනයේ පාලන අංශය වෙතින් **2024.04.17** දින සිට **2024.05.06** දින දක්වා සතියේ දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ලංසු ලියවිලි ලබා ගත හැකි අතර ලංසු ලියවිලි ගාස්තු ගෙවීමකින් තොරව පාලන අංශ කාර්යාලයේදී පරීක්ෂා කිරීමට හැකිය.
3. අධ්‍යක්ෂක ජනරාල් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය නමින් ශ්‍රී ලංකා රුපියල් පනස්දහසක් (50,000) වටිනාකමින් යුතුව 2024.07.31 දක්වා වලංගු කොන්දේසි රහිත ලංසු සුරක්ෂණයක් ලබා දිය යුතුවේ.
4. ලංසු භාරගන්නා අවසාන දිනය **2024.05.07** දින පෙ.ව. 10.00 වේ. එම වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබන අතර ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ.
5. මේ සම්බන්ධයෙන් පූර්ව ලංසු රැස්වීමක් **2024.04.25** දින පෙව. 10.00 ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සාකච්ඡා කාමරයේදී පවත්වනු ලැබේ.
6. සියළු තාක්ෂණික හා මූල්‍ය යෝජනා ලංසු වෙන වෙනම කවරවල බහ මුද්‍රා තබා එම කවර වල දකුණු ඉහළ කෙලවර තාක්ෂණික හා මූල්‍ය යෝජනා ලෙස වෙන වෙනම සඳහන් කර එම ලංසු කවර දෙක වෙනම කවරයක බහා මුද්‍ර තබා **2024.05.07** දින පෙ.ව. 10.00ට පෙර ලැබෙන සේ **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් ආයතනයේ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" ස්ලීඩා ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

වැඩි විස්තර දුරකතන අංක 011-5980271 / 011-5980293 මගින් ප්‍රසම්පාදන නිලධාරී ඇමතීමෙන් ලබාගත හැකිය.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය,28/10, මලලසේකර මාවත, කොළඹ 07**

දු.ක.අංක : **011-5980200** ෆැක්ස්: **011-2584406** ඊ-මේල් : **mail@slida.gov.lk**